සියලු හිමිකම ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

29 S I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 13 - 2018**

විභාග අංකය ............................ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I කාලය පැය දෙකයි

- **අංක 1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරා නියමිත අංකයේ කතිරයක් (x) යොදන්න.**

01. විලියම් මහතා තම හිතවතෙකුට දුරකථන ඇමතුමක් ලබාගනිද්දී ''ඔබ ඇමතූ ග්‍රාහකයා කාර්යබහුල බැවින් මේ මොහොතේ සම්බන්ධ කළ නොහැක' යන්න භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රතිචාදනය විය. මෙහි ග්‍රාහකයා වන්නේ,
    1. විලියම් මහතා කථා කළ දුරකථනයයි.
    2. ඔහුගේ හිතවතාගේ දුරකථනයයි.
    3. විලියම් මහතාගේ හිතවතායි.
    4. දුරකථන සේවා සැපයූ ආයතනයයි.
    5. මෙහි ග්‍රාහකයෙක් දැක්විය නොහැක.

02. සීමා සහිත සන්නිවේදනයක් සිදුකළ හැකි මාධ්‍යයකි,
    1. රූපවාහිනිය
    2. ගුවන් විදුලිය
    3. ශාරීරික භාෂාව
    4. මුද්‍රිත මාධ්‍ය
    5. නව මාධ්‍ය

03. පුද්ගලයෙකු සමඟ සන්නිවේදනයේදී ඍජුව අසන්නාගේ මුහුණ බලාගෙන කතා කිරීමෙන්,
    - A අසන්නාගේ අවධානය බිඳීයාම වළක්වාගත හැකිය.
    - B අසන්නා ආකර්ෂණය කරගත හැකිය.
    - C සබකෝලයක් ඇතිවේ.
    - D අසන්නා කුපිත වේ.
    - E අසන්නා අප්‍රසන්න හැඟීමක් ඇතිකර ගනී.

    1. C, E  2. C, D  3. D, E  4. A, B  5. B, C

04. පන්ති කාමර මාධ්‍ය උපකරණ ලෙස භාවිතා කළ හැකි බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයක ලක්ෂණ තෝරන්න.
    - A දුරස්ථ පාලකයක් මගින් ක්‍රියාත්මක කළ හැකිය.
    - B ප්‍රක්ෂේපණ යන්ත්‍රයට ඉදිරියෙන් තිරයක් තිබීම අවශ්‍ය වේ.
    - C පරිගණක තිරයේ සටහන් විශාල තිරයකට ප්‍රක්ෂේපණය කිරීමට මෙය යොදාගනු ලබයි.
    - D මෙය භාවිතයට ශබ්ද විකාශන පහසුකම් අවශ්‍ය නොවේ.
    - E මෙයින් වීඩියෝ ප්‍රක්ෂේපණ කළ නොහැක.

    1. A,B,C  2. B, C, E  3. B,D,E  4. C,D,E  5. D,E

05. ගෝලීයකරණය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,
1. සංස්කෘතික පුරුෂාර්ථ මත ගොඩ නැගුණකි.
2. පිළිගත් පොදු න්‍යායක් මත සකස් වී තිබේ.
3. සමාජ සම්බන්ධතාවයන්ට බල නොපායි.
4. බහුමානයන්ගෙන් සහ සියළු විෂයන් පුරා පැතිරී පවතියි.
5. සමාජීය විවිධතා මත ඛණ්ඩනය කරන්නකි.

06. පහත සඳහන් වාක්‍ය අතරින් ස්ව සංකල්පයට අයත් වන්නේ,
1. තීරණ ගැනීමට තාර්කික චින්තනය වැදගත්වීම.
2. පුද්ගලයෙකුගේ වයස වෙනස්වීමත් සමග ඉගෙන ගැනීමේ රටාවන් වෙනස්වීම.
3. ඉගෙනීම සමග චර්යාත්මක වෙනස්වීමක්ද සිදුවිය යුතුවීම.
4. තම හැකියාවන් පිළිබඳව තමාටම අදහසක් ඇතිකරගත හැකිවීම.
5. හැඟීම් පාලනය කරගැනීමෙන් සිතිවිලි පාලනය කරගත හැකිවීම.

07. සංවර්ධන සන්නිවේදන චීන ආකෘතියට අදාළ නොවන වැකිය තෝරන්න.
1. මෙම ආකෘතියට පදනම් වී ඇත්තේ මාක්ස්වාදයයි.
2. ප්‍රජානනයේදී සිදුවන්නේ ප්‍රමුඛත්වය දියයුතු ප්‍රශ්න තෝරා ගැනීමයි.
3. ඒක පුද්ගල සාමූහික විඥානයක් ගොඩ නැංවීම මෙම ආකෘතියේ අරමුණක් වෙයි.
4. සදාචාරය තහවුරු කිරීමේ නිර්ණායකය පිළිබඳවද මෙහි සැලකිල්ල යොමුකරයි.
5. කුඩා කණ්ඩායම්වලට මෙහි මුල්තැනක් ලැබෙයි.

08. රූපවාහිනියේ ළමා කාටූන් ප්‍රචාරය වන අතරතුරු, කිසියම් කිරි පැකට්ටුවක් සමග ක්‍රීඩා භාණ්ඩයක් නොමිලේ ලබාදෙන බවට ආකර්ෂණීය වෙළෙඳ දැන්වීමක් ප්‍රචාරය වෙයි. මේ නිසා දරුවන් බොහෝ දෙනෙකු එම කිරි වර්ගය ඉල්ලුම් කරයි. මෙය විද්‍යුත් මාධ්‍යයෙන් සිදුවන,
1. මානසික බලහත්කාරකමකි.
2. ඉගෙනුම් උත්තේජකයකි.
3. කායික පෝෂණකාරකයකි.
4. දෙමාපියන් සහ දරුවන් අතර සබඳතාවය වර්ධනය කරන්නකි.
5. දරුවන් කෙරෙහි කරුණාවෙන් ව්‍යාපාරික අවධානය යොමුකරවන්නකි.

09. ක්‍රීඩා උත්සවයේදී ක්‍රීඩක - ක්‍රීඩිකාවන් අමතමින් ක්‍රීඩා ඇමතිවරයා ක්‍රීඩාවේ සුවිශේෂී ගුණාංග පිළිබඳව හරවත් දේශණයක් කළේය. මෙහි අදාළ භාෂා ප්‍රභේදය වන්නේ,
1. භාෂණය 2. රූපණය 3. විවරණය 4. නිවේදනය 5. කථනය

10. විකල්ප සහ විරෝධාකල්ප මාධ්‍ය සම්බන්ධ නිරවද්‍ය ප්‍රකාශය වන්නේ,
1. ක්ෂණිකව වර්තාකරණය කළහැකි වීම.
2. වේගවත් වාර්තාකරණයක් කළහැකි වීම.
3. පුරවැසියන් විසින්ම මාධ්‍යයට වාර්තාකරනු ලැබීම.
4. සම්ප්‍රදායික තොරතුරු පමණක් ඉදිරිපත් කරනු ලැබීම.
5. සමාජය සාධාරණ, හිතකර දිශාවකට ගෙනයාමට උත්සාහ කිරීම.

11. පුවත්පතක සතිපතාම පළවූ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය පාඩම් මාලාව අතිරේකව පරිහරණය කළ බුද්ධික විභාගයේදී ඉහළ ලකුණු ලබාගත්තේය. මෙයින් පැහැදිලි වන කරුණක් වන්නේ,
1. පුවත්පත භාවිතා කළ හැක්කේ භාෂාව පිළිබඳ පුළුල් දැනුමක් ඇති අයට පමණක් බව.
2. ඉගෙනුම් මෙවලමක් ලෙස භාවිතා කළ හැක්කේ අධ්‍යාපනික පුවත්පත් පමණක් බව.
3. ජනමාධ්‍ය විවිධ උපක්‍රම මගින් නිදහස් අධ්‍යාපනය හෑල්ලුවට ලක්කරන බව.
4. ජනමාධ්‍යයට අධ්‍යාපනික අත්වැලක් වීමේ විශාල ශක්තියක් ඇති බව.
5. විද්‍යුත් මාධ්‍යයට වඩා මුද්‍රිත මාධ්‍යයට අධ්‍යාපනික කටයුතු සඳහා මගපෙන්විය හැකිබව.

12. මහජන සම්බන්ධතා සැලැස්මක් සම්පාදනය සම්බන්ධයෙන් නිරවද්‍ය වන්නේ,
1. සැලැස්ම සිදු කිරීම රහසිගතව සිදුකළ යුතු බව.
2. ක්‍රම විධි සහ උපාය මාර්ග අතර සම්බන්ධතාවයක් අවශ්‍ය නොවන බව.
3. සැළැස්ම සකස් කිරීමට අයවැය ඇස්තමේන්තුවක් තිබිය යුතු බව.
4. සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම ආයතනයේ කළමනාකාරීත්වය විසින් ඉටුකළ යුතු බව.
5. සැලැස්ම නැවත සංශෝධනය කළ නොහැකි බව අවධාරණය කළයුතු බව.

13. තිදෙනෙකුගේ විවිධ අදහස් පහත සඳහන් වෙයි.

සුමේධ - අද ජනමාධ්‍යවලින් පෙන්වන්නෙ පාර්ලිමේන්තුවෙ රණ්ඩුවෙන හැටියි, රිය අනතුරුයි, ආපදායි විතරයි.

භාග්‍ය - නිදහසේ අදහස් ප්‍රකාශ කිරීම මාධ්‍යයට නිදහස තියෙන්ඩ ඕනෙ.

සමන් - දේශීය සංස්කෘතියේ රැක ගත යුතු දේ පිළිබඳවත් මාධ්‍ය අවධාරණය කරන්න ඕනෙ.

මෙම ප්‍රකාශ වලින් සමාජ වගකීම් පිළිබඳ සන්නිවේදන සංකල්පය නිරූපණය කරන්නේ,
1. සුමේධගේ ප්‍රකාශයයි.
2. භාග්‍යගේ ප්‍රකාශයයි.
3. සමන්ගේ ප්‍රකාශයයි.
4. භාග්‍යයගේ සහ සමන්ගේ ප්‍රකාශවලින් වීමයි.
5. සුමේධ සහ භාග්‍යගේ ප්‍රකාශවලින් වීමයි.

14. උප භාෂා භාවිතය සම්බන්ධ නිවැරදි නොවූ වැකිය වන්නේ,
1. උප භාෂාවන් තුළ සම්මත ව්‍යවහාරයට ආවේනික නොවූ වචන සහ යෙදුම් බිහිවෙයි.
2. ප්‍රාදේශීයව උප භාෂා භාවිතා කරන්නන්ට සම්මත භාෂා ව්‍යවහාරය සමඟ නිරන්තරයෙන් සම්බන්ධවීමට ලැබෙන්නේ ජනමාධ්‍ය පරිහරණය මගිනි.
3. ජනමාධ්‍ය තුළ උප භාෂා ව්‍යවහාරයන්ට ඇත්තේ අවම වූ සීමාසහිත ඉඩ අවකාශයකි.
4. උප භාෂාවකින් නිරූපණය වන්නේ ජාතික සංස්කෘතියයි.
5. ශ්‍රී ලංකාවේ සිංහල භාෂාවත්, දෙමළ භාෂාවත් උප භාෂා ප්‍රවණතා රැසකින් සමන්විත වේ.

- **15 - 16 ප්‍රශ්න සඳහා ප්‍රයෝජනයට ගන්න.**

| | | | | |
|---|---|---|---|---|
| **A**<br>**ආත්ම භාෂණය** | **B**<br>**ගාබ්නර්** | **C**<br>**තාක්ෂණික භාවිතය** | **D**<br>**ෂැනොන්-වීවර්** | **E**<br>**වාචික සන්නිවේදනය** |
| **F**<br>**කටහඬ** | **G**<br>**බාර්ලෝ** | **H**<br>**ලිඛිත සන්නිවේදනය** | **I**<br>**ශ්‍රාම්-ඔස්ගුඩ්** | **J**<br>**බෘස් වෙසට්ලි** |

15. විශාල ජන සමාජයකට එකවර තොරතුරු ගෙන යා හැකි ජන සන්නිවේදනයේ ප්‍රධාන ලක්ෂණයකි.
1. A 2. F 3. C 4. E 5. H

16. සමාජ විද්‍යාත්මක සහ ජීව විද්‍යාත්මක දෘෂ්ටියකින් සන්නිවේදන ක්‍රියාවලිය සම්බන්ධ ආකෘතියක් ගොඩ නඟමින් තාක්ෂණික ක්‍රියාවලියකට වඩා මානව හැසිරීම් සන්නිවේදන ක්‍රියාවලියේ ක්‍රියාත්මකවන ආකාරය පිළිබඳව අවධානය යොමු කරමින් සන්නිවේදන ආකෘතියක් ගොඩනගන ලද්දේ,
1 D 2. G 3. B 4. I 5. J

17. ශ්‍රී ලංකාවේ ප්‍රථම ප්‍රාදේශීය ගුවන්විදුලි සේවය වන්නේ,
1. මහවැලි ප්‍රජා ගුවන්විදුලියයි. 2. වයඹ හඬ ගුවන් විදුලියයි. 3. රජරට සේවයයි.
4. කඳුරට සේවයයි 5. රුහුණු සේවයයි

18. තරප්පු පෙළ නගිමින් සිටි සිදත් ඉදරියෙන් පැමිණි කිසිවෙකුගේ ඇඟේ හැප්පුණේය. ඔහු හැරී බැලීමටත් පෙරම සිදත් ''සමාවෙන්න'' යයි කී නිසා, ඉදිරියෙන් ආ පුද්ගලයා කෝපය යටපත් කරගෙන, ''ආ... කමක් නෑ.. ඒක සුළු දෙයක්...'' යයි පවසා මඳ සිනහවක් පා පිටව ගියේය. මෙයින් පැහැදිලි වන්නේ,
1. සහානුභූතිය සංවේදී ස්වභාවයක් ජනිත කළ බවයි.
2. ආචාරශීලීත්වය, ප්‍රසන්න වාතාවරණයක් ගොඩ නැගූ බවයි.
3. හැඟීම් ප්‍රකාශනයට සුදුසු වාතාවරණයක් සැකසුණු බවයි.
4. අවට පරිසරය පිළිබඳව විමසිලිමත් නොවීමෙන් අන්‍යයන් අපහසුවට පත්වන බවයි.
5. පුද්ගලයන්ගේ හැසිරීම් මගින් ඔවුන්ගේ චිත්ත ස්වභාවයන් ප්‍රකාශ කරන බවයි.

19. නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.
1. සමාජය සතුන් සහ මිනිසා මුල්කරගෙන බිහිවී තිබේ.
2. සම්පත් හිමිකම සමාජයක බලය කේන්ද්‍රවීමට හේතුවක් වී තිබේ.
3. ජනමාධ්‍යයන්ට සමාජ බලකේන්ද්‍රයන්ට අභියෝග එල්ලකළ නොහැකිවී තිබේ.
4. සමාජයක ආර්ථික හා නිෂ්පාදන බලවේග පවතින්නේ උපරි ව්‍යුහය තුළය.
5. රොබෝවරුන් විසින් ලෝකයේ බුද්ධිමය සම්පත් නිර්මාණය කරනු ලබයි.

20. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
1. ව්‍යාපාරික ආධිපත්‍යය විසින් මාධ්‍ය මෙහෙයවයි.
2. මාධ්‍ය දූන්වීම්කරණය සමාජීය අවශ්‍යතාවයක් වෙයි.
3. සංස්කෘතික හුවමාරුව නිසා සමාජ සංවර්ධනයක් සිදුවෙයි.
4. ව්‍යාපාරික අනුග්‍රහයෙන් තොරව මාධ්‍යයට ස්වාධීනව ක්‍රියාකළ හැකිය.
5. ගෝලීයකරණය නිසා නව ලිබරල්වාදය ගොඩනැගී තිබේය.

21. 'ජනප්‍රිය සංස්කෘතිය' යන්නට අදාළ වන වාක්‍යය වන්නේ,
1. ජනප්‍රිය සංස්කෘතිය සුභසාධන ක්‍රියාවලීන් හා බැඳී පවතියි.
2. ජනප්‍රිය සංස්කෘතිය වාණිජ අරමුණු මූලික කරගත් ව්‍යාපාරයන් සමග කටයුතු නොකරයි.
3 ජනප්‍රිය සංස්කෘතිය මාධ්‍ය සාක්ෂරතාවයේ සංකල්පයකි.
4. ජනප්‍රිය සංස්කෘතිය පරිභෝජනයට මාධ්‍ය අධ්‍යාපනය අවශ්‍ය වේ.
5. ජනප්‍රිය සංස්කෘතිය තුළ පවතින්නේ නිර්මාණාත්මක භාවයට වඩා වාණිජමය නිෂ්පාදනයන් ය.

22. වාහනයක් අනතුරකට ලක්වූ පසු ඊට වන්දි ලබා ගන්නා ආකාරය රූපවාහිනී වැඩ සටහනකින් දැනුවත් වී තිබුණු නිසා සමරසිංහ මහතාට, තම වාහනය අනතුරට පත්වූ අවස්ථාවේ රක්ෂණ වන්දිය ලබාගැනීම පහසු විය. ඔහු ලැබූ ජනමාධ්‍ය අධ්‍යාපනික සංදේශ ස්වරූපය වන්නේ,

1. මෙහෙයුම් සංදේශ　2. නඩත්තු සංදේශ　3. ක්‍රියාකාරී සංදේශ
4. ශක්තිජනක සංදේශ　5. ප්‍රතිෂ්ඨාපන සංදේශ

23. ගැටුමක් ධනාත්මකව හැසිරවීම යන්නට සමාන නොවන්නේ,
1. ගැටුම් කළමනාකරණය
2. ගැටුමේ ප්‍රචණ්ඩත්වය පාලනය කිරීම.
3. ගැටුම් නිරාකරණයට සුදුසු සීමාවකට පත්කිරීම
4. ගැටුම් වෙනත් දිශාවන්ට ගමන් කරවීම.
5. ගැටුම ඵලදායී ආකාරයකට හැසිරවීම.

24. **A කොටස**

A - කාංසාව　B - වික්ෂිප්තතාව　C - මෛත්‍රිය හා අවිහිංසාව　D - බයිබලය　E - කුරාණය

**B - කොටස**

1. ඔබට මෙන් ඔබේ අසල්වැසියාටද ප්‍රේම කරන්න.
2. බුදු දහමේ ප්‍රධාන මූලධර්මයන් දෙකකි.
3. එකම සිතවිල්ල නැවත නැවත හට ගැනීම.
4. දැඩි ලෙස ආවේගශීලී වීමේ ප්‍රතිවිපාකයකි.
5. එකිනෙකාට විකට නම්වලින් අපහාස නොකරනු.

B කොටසට ගැළපෙන වචන A කොටසින් තේරූ විට නිවැරදි පිළිවෙළ වන්නේ,

1. D, C, B, A, E　2. C, B, A, E, D　3. A, B, C, D, E
4. E, B, D, C A　5. B, E, A, C, G

25. ගෘහයක් ලෙස හැඳින්විය හැක්කේ,
1. කිසියම් පිරිසක් ජීවත්වන භෞතිකමය ගොඩනැගිල්ලකි.
2. ආසන්න ඥාති සම්බන්ධතාවයක් ඇති පිරිසක් ජීවත්වන ස්ථානයකි.
3. තනි තනිව තම අභිමතාර්ථයන් ඉටුකර ගැනීමට යෙදී සිටින නවාතැන්පොළකි.
4. සියළු අංගෝපාංගයන්ගෙන් සමන්විත සුඛෝපභෝගී ගොඩනැගිල්ලකි.
5. ජන සන්නිවේදන මාධ්‍ය මගින් හසුරුවන පවුල් සංස්ථාවකි.

26. 'සංවර්ධනය' පිළිබඳ නිර්වචනයේදී මහාචාර්ය විමල් දිසානායකයන් දක්වන්නේ,
1. දරිද්‍රතාව, සාක්ෂරතාඥානයේ ඌන බව, අඩු ආයු අපේක්ෂණය යනාදියෙන් තොරවීම සංවර්ධනය බව.
2. මන්දපෝෂණය, අඩුබර උපත්, නූගත් බව, බෝ නොවන රෝග ව්‍යාප්තිය යනාදියෙන් තොරවීම සංවර්ධනය බවයි.
3. ආත්ම විශ්වාසයෙන් යුතු ප්‍රජාව, කාර්මීකරය, නාගරීකරණය, ජන සන්නිවේදන මාධ්‍යයේ දියුණුව රටක සංවර්ධනයේ ලක්ෂණ බවයි.
4. ආර්ථක සංවර්ධනය, සමාජ සංවර්ධනය, සංස්කෘතික සංවර්ධනය සහ සදාචාරාත්මක සංවර්ධනය ජාතික සංවර්ධනයේ අංග බවයි.
5. ජනමාධ්‍ය භාවිතයෙන්, ජාතික හැඟීම්, ජාතික අපේක්ෂා, නවතාක්ෂණයෙන් නව හැකියාවන් වර්ධනය කිරීම සංවර්ධනය බව.

27. 'අනුග්‍රාහකත්වය' සම්බන්ධයෙන් නොගැලපෙන වගන්තිය තෝරන්න.
1. විවිධ සමාජ ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම අනුග්‍රාහකත්වයෙන් සිදුවේ.
2. අනුග්‍රාහකත්වයේ අරමුණු වන්නේ සංවිධානයක කීර්තිනාමය වර්ධනය කර ගැනීමයි.
3. අනුග්‍රාහකත්වය තුළින් අනුග්‍රාහක ආයතනය පිළිබඳ මහජන අවබෝධය වර්ධනය වෙයි.
4. මත්ද්‍රව්‍ය සහ දුම්වැටි නිෂ්පාදකයක් අනුග්‍රාහකත්වය ලබා දීමෙන් ඉහළ ප්‍රචාරයක් ලබාගනියි.
5. ප්‍රචාරක දැන්වීමකට වැඩි ප්‍රසාදයක් අනුග්‍රාහකත්වයෙන් ලබාගත හැකිවෙයි.

28. ගෝලීයකරණ ප්‍රවණතාවයක් ලෙස ශ්‍රී ලංකාව තුළ ජනමාධ්‍ය, ඒකීය පද්ධතියක් බවට පත්වී තිබේ. මෙය සිදුවන්නේ,

1. රූපවාහිනිය　　2. සිනමාව　　3. අන්තර්ජාලය
4. පුරවැසි මාධ්‍ය　　5. විරෝධාකල්ප මාධ්‍ය හරහාය

29. සංස්කෘතිය ගොඩ නංවන්නේත්, පවත්වාගෙන යන්නේත්, මිනිසා විසින්ම වන අතර මාධ්‍ය සංස්කෘතියේ ලක්ෂණ ක්‍රමයෙන් සංස්කෘතිය විසින් භාරගෙන ඇති බව පෙනී යන්නේ,
1. මාධ්‍ය සංස්කෘතිය සමාජ අවශ්‍යතාවයක් බැවිනි.
2. මාධ්‍ය සංස්කෘතිය ජන සංස්කෘතියේ ව්‍යාප්තියක් බැවිනි.
3. මාධ්‍යයේ අධිකාරී බලය සම්ප්‍රදායික සමාජය ගිලගෙන ඇති බැවිනි.
4. නොකඩවා වෙනස්වීම සමාජ සංස්කෘතියේ සාමාන්‍ය ලක්ෂණයක් වන බැවිනි.
5. මාධ්‍ය සංස්කෘතික ව්‍යාප්තිය සැලසුම් සහගතව ජාත්‍යන්තර වශයෙන් සිදුවන්නක් බැවිනි.

30. පාසල් ශිෂ්‍යයන්ට විෂය කරුණු මතකයේ තබාගැනීමට භාවිතයට ගතහැකි ක්‍රමයකි, යමක් තවත් දෙයකට සමානකොට දැක්වීම. මෙය.
1. විවිධ වර්ගවල තොරතුරු රාමුවකට ගැනීම.
2. එකිනෙකට සම්බන්ධ තොරතුරු එක් කිරීම.
3. යම් යම් තොරතුරු අවශ්‍ය පිළිවෙළට ලියා ගැනීම.
4. මනඃකල්පිතව ගොඩ නංවා ගැනීම.
5. උපමා වාක්‍ය හෝ උපමා උපමේය යොදා ගැනීම.

31. මාධ්‍ය සංස්කෘතියට සමාජයට බලපෑම් කළ හැකි අවස්ථා වන්නේ යම් සමාජයක,

A පවතින සංස්කෘතිය බලවත්ව පවතින විට

B මාධ්‍ය සංස්කෘතියේ අංග බලවත්ව පවතින විට

C පවතින සම්ප්‍රදායික සංස්කෘතිය දුර්වලව පවතින විට

D මාධ්‍ය සංදේශවල යථාර්ථය අවබෝධ කරගැනීමට සමාජය නොපෙළඹෙන විට

E මාධ්‍ය සාක්ෂරතාවයෙන් යුතු පිරිස බහුල වන විට

1. B, C, D 2.A, B, D 3. C, D, E 4. A, D, E 5. B, C, E

32. පවුල් ඒකකයක සියළු සාමාජිකයන් අවම වශයෙන් රාත්‍රී ආහාරයවත් එක්ව ගැනීමෙන් සිදුවන යහපතකි.

1. නිහඬව රූපවාහිනිය බලමින් ආහාර ගතහැකි වීම.
2 ප්‍රිය සම්භාෂණයේ යෙදෙමින් සාමය, සහජීවනය ගොඩ නගාගත හැකිවීම.
3. ආහාරවල රස - නීරස දැණුවත් කළ හැකිවීම.
4. දිනය තුළ සිදු කළ වැරදි අඩුපාඩු සඳහා බැණුම් ඇසීමටත්, දොස් කීමටත් අවස්ථාවක් ලැබීම.
5. ඕපාදූප කථා කිරීමටත්, අන්‍යයන්ට අපහාස කිරීමටත් හැකිවීම.

33. සංවර්ධන ව්‍යාපෘතියක ඉලක්කය වූයේ හැම ගමකම පුරන්වී ඇති කුඹුරු හෙක්ටයාර් 25බැගින් සාර්ථකව අස්වැද්දීමයි. මේ සඳහා මෙහි වගා කිරීමට කුඹුරු තෝරා ගැනීමේ නිවැරදි උපාය මාර්ගය වන්නේ,

1. ග්‍රාම සේවක නිලධාරීන්ගේ නිර්දේශයට පමණක් අනුමැතිය ලබාදීමයි.
2 ප්‍රාදේශීය ලේකම්තුමාගේ නිර්දේශයට අනුමැතිය ලබාදීමයි.
3. ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමාගේ නිර්දේශය මත අනුමැතිය ලබාදීමයි.
4. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පොදු නිර්දේශයකට අනුව අනුමැතිය ලබාදීමයි.
5. ඉඩම් නොමැති අයට පුරන්ව ඇති කුඹුරු බෙදා දීමේ නිර්දේශයකට අනුමැතිය ලබාදීමයි.

34. පවතින සංස්කෘතියෙන් අගය කරනු ලබන අංග බාහිර සංස්කෘතිකාංගවලින් යටපත්වීමෙන් සමාජයක් තුළ ඇතිවන සංවේදීභාවය.

1. සංස්කෘතික ආක්‍රමණයයි. 2. සංස්කෘතික කම්පනයයි. 3. සංස්කෘතික ත්වරණයයි.
4. සංස්කෘතික රාශිකෘත්‍යයයි. 5. සංස්කෘතික විසරණයයි.

35. ජනප්‍රිය සංස්කෘතියේ ව්‍යාප්තිය මඟින් ප්‍රධාන වශයෙන්ම වාසි ලබන්නේ,

A පාසල් දරුවන්ය. B රජයයි. C ව්‍යාපාරිකයන්ය

D කාන්තාවන්ය. E බහුජන මාධ්‍යයි.

1. A, D, E 2.A, C, D 3. B, E 4. C, E 5. A, D

36. කිසියම් භාෂාවක් ජීව භාෂාවක් බවට පත්ව තිබීමේ ප්‍රධානම සාධකය වන්නේ එම භාෂාව,

1. සන්නිවේදන කාර්යයන් සඳහා අඛණ්ඩව භාවිතා කිරීම.
2. අධිපති භාෂාවන් සමඟ මිශ්‍රව භාවිතා කිරීම.
3. පාසල් අධ්‍යාපනය අධිපති භාෂාවන්ගෙන් ලබාදීම.
4. කාර්යාල කටයුතු ඇතුළු රාජ්‍ය අංශය සඳහා මද වශයෙන් භාවිතා කිරීම.
5. නවීකරණයත් සමග මතුවන තත්ත්වයන්, ක්‍රියාවලීන් හැඳින්වීමට විදේශීය භාෂාවන් භාවිතා කිරීම.

37. මහජන සම්බන්ධතා සැලැස්මක පෙර ඇගයීමක කාර්යයන් වන්නේ,

A - අයවැය ඇස්තමේන්තුවට ඔරොත්තු දෙන සැලැස්මක් ද යන්න දැන ගැනීම.

B - වෙනත් විකල්පයන් තිබේදැයි තක්සේරු කිරීම

C - අවශ්‍ය සැලැස්මේ වෙනස්කම් කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම.

C - මෙම සැලැස්ම ක්‍රියාත්මක කළහැකි සැලැස්මක්ද යන්න තීරණය කිරීම.

E - සැලැස්ම නියාමනය කිරීම

1. A,B 2. C, D 3. A, C, D 4. B, D, E 5. D, C, E

38. රූපවාහිනී මාධ්‍යයත්, ගුවන් විදුලි මාධ්‍යයත් තුළ කථනය භාවිතා කිරීම සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. රූපවාහිනී මාධ්‍යයේදී කථනය සහ රූපය අතර ඒකාත්මික බව අවශ්‍ය වේ.
2. ගුවන් විදුලි මාධ්‍යයේදී කථකයාගේ මාධ්‍ය කටහඬයි.
3. ගුවන් විදුලි මාධ්‍යයේදී ග්‍රාහකයා සංජානනය කරගන්නේ කථකයාගේ රූපණය ගැනද සැලකිල්ල නොදක්වමිනි.
4. රූපවාහිනියේදී භාෂාව හා රූපණය සමානව ප්‍රබලව තිබීම අත්‍යවශ්‍ය වේ.
5. ගුවන් විදුලියේ භාෂා භාවිතය අසන්නන්ගේ පරිකල්පනය ඉහළ නැංවීමට යෝග්‍ය විය යුතුය.

39. භාෂාවේ සංයුක්ත සංකල්පය යනු,

1. දෘශ්‍ය ලෙස දැකිය හැකි වස්තූන් හඳුන්වන සංකල්පයකි.
2. අතට හසු නොවන, දැකබලා හඳුනාගත නොහැකි දේ හඳුන්වන සංකල්පයකි.
3. ශබ්දය හා පද අතර කිසිදු හැලහැප්පීමක් දක්නට නොලැබෙන සංකල්පයකි.
4. පාරිසරික ශබ්ද සමග සමපාත වන වචන හඳුන්වන සංකල්පයකි.
5. නව අදහස්, තොරතුරු භාෂාව යොදාගෙන විස්තර කිරීමට ඇති හැකියාව පෙන්වන සංකල්පයකි.

40. ගෘහයක සාමය සහ සහජීවනය බිඳ වැටී ගෘහයේ පැවැත්ම කෙරෙහි එය බලපෑමේදී,

1. පරාර්ථකාමී සමාජයට වැඩදායී පිරිසක් බිහිවේ.
2. දරුවන්ට පහසුවෙන් අධ්‍යාපන කටයුතු සිදුකර ගතහැකි වේ.
3. තමන්ගේ බලාපොරොත්තු ගෘහයේ අනිත් සාමාජිකයන්ගේ මැදිහත්වීමකින් තොරව ඉටුකරගත හැකිවේ.
4. ගෘහයේ අපේක්ෂා බිඳ වැටී දියුණුව ඇණ හිටියි.
5. වෙනත් ගෘහයන් සමඟ සන්සන්දනය කර සතුටුවිය හැකිය.

41. සංවර්ධන ව්‍යාපෘතියකදී විවේචනාත්මක හා විමර්ෂණාත්මක සාකච්ඡාවකින් බලාපොරොත්තුවන අරමුණකි.

1. කිසියම් අතපසුවීමක් සිදුවී තිබේද එය සිදු කළේ කවුරුන් විසින්ද යන්න දැනගැනීම.
2. ව්‍යාපෘති කණ්ඩායමේ තරාතිරම තේරුම් ගැනීම.
3. අයවැය පිළිබඳ විස්තර දැන ගැනීම.
4. ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වයේ සැබෑ ස්වරූපය අනාවරණය කරගැනීම.
5. ව්‍යාපෘතියේ වංචා දූෂණ තිබේදැයි හෝඩුවාවක් ලබා ගැනීම.

42. ශ්‍රී ලංකාවේ සංවර්ධන සන්නිවේදන සුසමාදර්ශයන්ට අයත් සංවිධානවල වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ පදනම වන්නේ,

1. දේශීය මූල්‍ය සම්පත්
2. ප්‍රජාවගේ මානව ශක්තීන්
3. විදේශීය මූල්‍ය සම්පත්
4. රාජ්‍ය දේපළ පෞද්ගලීකරණය කිරීමේ හැකියාව.
5. අවධානම්වලට මුහුණදීමේ හැකියාව.

43. සමාජ සංයුතිය තුළ ප්‍රජාමූල අංශය සමන්විත වන්නේ,

A සාමූහික ගතිගුණ B අන්‍යෝන්‍ය සහයෝගීතාවය C පුද්ගලිකත්වය

D රාජ්‍ය ව්‍යවසාය E ගතිකත්වය

1. A, B 2. A, C 3. C, D 4. C, E 5. D, E

44. මාධ්‍ය සංස්කෘතිය යනු,

1. ග්‍රාමීය සම්ප්‍රදායික සමාජයේ පැවති සංස්කෘතියයි.
2. සමාජ විද්‍යාත්මක සමාජයක් අර්ථකථනය කරන ක්‍රමවේදයයි.
3. ජනමාධ්‍යයෙන් තොරව පවතින සමාජවල සංස්කෘතියයි.
4. මාධ්‍යයේ බලපෑම බලවත්ව ඇති සමාජයේ සංස්කෘතියයි.
5. මාධ්‍යයට අභියෝග කරන ලැග්ම සංස්කෘතියයි.

45. ග්‍රාහක සහභාගිත්ව සංවර්ධන සංදේශයක් නිර්මාණය කිරීමේ පියවර තෝරන්න.

A සන්දේශයේ අන්තර්ගතය නැවත සලකා බලා බහුජන නිෂ්පාදනයට යොමු කිරීම.

B පූර්ව තක්සේරුවක යෙදීම.

C අදාළ සෑම තොරතුරක්ම අධ්‍යයනය කිරීම.

D ග්‍රාහක ජීවන රටාවන්, ලැදියාවන් අභිමතයන් විශ්ලේෂණය කිරීම.

E සන්දේශයට අනුව මැණිය හැකි ඉලක්ක ලේඛනගත කිරීම.

1. A, B, C, D, E 2. C, D, E, B, A 3. C, D, B A. E
4. B, E, D, A C 5. E, A, B, D, C

46. ප්‍රදේශයේ ජනතාවට පහසු මිලටත්, තම සංස්කෘතියට ගැළපෙන ලෙසත් ආකර්ෂණීය ඇඳුම් - පැළඳුම් මිලදී ගැනීමට වෙළෙඳ සැලක් ආරම්භ විය. එහි මහජන සම්බන්ධතාවය වර්ධනයට ගතහැකි පහත සඳහන් ක්‍රම විධි සහ උපාය මාර්ග අතරින් උපාය මාර්ග තෝරන්න.

A මුද්‍රිත මාධ්‍ය දැන්වීම් යොදා ගැනීම.

B වෙළෙඳ සැල විවෘත්ත කිරීමට ජනාධිපතිවරයාට ආරධනා කිරීම.

C ආරම්භක දිනයේ වෙළෙඳ සැලෙන් මිලදී ගන්නා සියළු දෙනාට ටොෆි, බැලුම්බෝල යනාදිය නොමිලයේ ලබාදීම

D වෙළෙඳ සැල සම්බන්ධ ඡායාරූප සහිත කටවුට් නගරයේ ප්‍රදර්ශනය කිරීම.

E රු. 2000 ට වැඩි භාණ්ඩ මිලදී ගත් පාරිභෝගිකයන්ට ලොතරැයියක් ඇදීම.

1. A, C, D 2. B, C, E 3. A, B, E
4. C, D, E 5. A, B, C, D, E සියල්ලම.

47. සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘති යෝජනාවකට ඇතුළත් නොවිය යුත්තේ,

1. ව්‍යාපෘතියට අවශ්‍ය සම්පත් සපයා ගැනීමට ආයෝජනයක් සිදුකිරීම.
2. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ හැකි ක්‍රම විධි.
3. ව්‍යාපෘතිය සඳහා යොදාගත හැකි උපාය මාර්ග.
4. ව්‍යාපෘතියට අදාළ සංවිධාන ව්‍යුහය ගොඩ නැංවීම.
5. ව්‍යාපෘතියට අදාළ පාර්ශවකරුවන් හඳුනා ගැනීම.

48. ක්‍රීඩා ලෝලීන් අතර, ආකර්ශණීය පුද්ගලයෙකු වූ නැගී එන ක්‍රීඩකයෙක් සම්බන්ධ කරගෙන කිරි නිෂ්පාදන ආයතනයක් තම ප්‍රචාරක කටයුතු සිදුකරයි. මෙහි සංවර්ධනය කරගෙන ඇති මහජන සම්බන්ධතා නිපුණතාව වන්නේ,

1. පරිසරය නිර්මාණයයි. 2. පුද්ගල ප්‍රතිරූපයයි. 3. මාධ්‍ය සාකච්ඡාවයි.
4. අත්දැකීම් පසුතලයයි. 5. මුද්‍රිත මාධ්‍ය නිපුණතාවයයි.

49. සංවර්ධනය ව්‍යාපෘතියකදී මුහුණ පෑමට සිදුවූ ගැටලු, අතපසුවීම් හා වැරදි පිළිබඳව ස්ථිරව දැක්විය හැක්කේ,

1. වාර්තාව සම්පාදනයේදී
2. වාර්තාව ඉදිරිපත් කිරීමේදී
3. ව්‍යාපෘතිය පිළිබඳ ස්වයං විවේචනයක් කිරීමේදී
4. තොරතුරු රැස්කිරීමේදී
5. ව්‍යාපෘතිය ඇගයීමට ලක්කිරීමේදී.

50. සංවර්ධන ව්‍යාපෘතියක අයවැය සම්පත් සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. මුල්‍ය සම්පත් යන්නට මුදල් වටිනාකම් අයත් වේ.
2. සම්පත් යන්නට භෞතික හා මානව සම්පත් අයත් වේ.
3. මූර්ත සම්පත් යන්නට මුල්‍ය සම්පත්වලින් මිලදී ගතහැකි දේ අයත් වේ.
4. මූර්ත සම්පත් යන්න මුල්‍ය සම්පත් යන්නට යෙදෙන විකල්පතාවයක් වෙයි.
5. ව්‍යාපෘති කළමනාකරණ කාර්ය යන්නට අයවැය පාලනය අයත් වේ.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 29 | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 13 - 2018**

විභාග අංකය .............................. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II කාලය පැය තුනයි

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) ශ්‍රව්‍ය සන්නිවේදනය සම්බන්ධ පහත සඳහන් අවස්ථා සඳහා උදාහරණ දෙක බැගින් සපයන්න.
    1. ශ්‍රව්‍ය සන්නිවේදනය මිථ්‍යා විශ්වාස සමඟ එකතුවන අවස්ථා
    2. ශ්‍රව්‍ය සන්නිවේදනය සවභාවිකව සිදුවන අවස්ථා
    3. පරිපාලන කටයුතු සඳහා ශ්‍රව්‍ය සන්නිවේදනය භාවිත අවස්ථා
    4. සැලසුම් සහගතව ශ්‍රව්‍ය සන්නිවේදනය සිදුකරන අවස්ථා (ල. 2)

    (ii) පුද්ගල චර්යාව පාලනයට අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය හේතුවන ආකාරය කරුණු දෙකකින් විස්තර කරන්න. (ල. 4)

    (iii) ලැස්වෙල් ආකෘතියේ සහ ෂැනොන් - වීවර් ආකෘතියේ සන්නිවේදන මූලිකාංග නම් කරන්න. මෙම ආකෘතිවල ඇති සමාන - අසමානතා වගුවක් සකස් කරන්න. (ල. 6)

    (iv) බොහෝ පාසල්වල තාප්පයට ඉහළින් සහ තාප්පය පුරා පාසල ලබාගත් විවිධ ජයග්‍රහණ පෙන්වන පෝස්ටර්, බැනර්, කටවුට් ප්‍රර්ශනය කරනු ලබයි. පාසල ව්‍යාපාරික ආයතනයක් නොවේ නම්, මහජන සබඳතාවය සඳහා එවැනි ප්‍රචාරාත්මක ක්‍රියාවලීන් අවශ්‍යවන්නේ කුමකටදැයි කරුණු 4ක් ආශ්‍රයෙන් විවරණය කරන්න. (ල. 8)

02. (i) අ). ඉගෙනුම් න්‍යායන් බැඳී පවතින්නේ කිනම් සන්නිවේදන වර්ගයක් සමඟදැයි දක්වන්න.
    ආ). මතකයේ රඳවා ගැනීම යන්න සරලව දක්වන්න. (ල. 2)

    (ii) වර්තමානයේ නව මාධ්‍ය මගින් සිදුවන සමාජානුයෝජනය, ජනමාධ්‍ය මඟින් සිදුවන සමාජානුයෝජනයට ද වඩා වගකීම් විරහිත බවක් දක්වයි. ඔබ මෙම අදහසට එකඟවේද? නොවේද? යන්න දක්වා ඊට හේතු දෙකක් දක්වමින් පැහැදිලි කරන්න. (ල. 4)

    (iii) පුද්ගල ස්වාධීනත්වය නැතිවී යාමට ජනමාධ්‍යයේ බලපෑම හේතුවන ආකාරය කරුණු 3ක් මඟින් විස්තර කරන්න. . (ල. 6)

    (iv) ගාන්ධිතුමාගේ සංවර්ධන සන්නිවේදන භාවිතයේ ජනතාව තුළ දැඩි හැඟීමක් ඇතිකළ පද 4ක් දක්වා ඒ කෙසේදැයි දක්වන්න. (ල. 8)

03. (i) මානසික ව්‍යාධියකින් පෙළුනු මැදිවියේ කාන්තාවක් හදිසියේ නිවසින් අතුරුදහන් විය. ඇය සොයාගැනීමට නිවැසියන්ට පොලීසියේ සහාය ලබාගැනීම හැරුණුවිට භාවිතා කළහැකි වෙනත් මහජන සම්බන්ධතා මෙවලම් 4ක් නම් කරන්න. (ල. 2)

    (ii) ''මිනිසා සමාජීය සත්ත්වයෙකි'' යන්නෙන් පැහැදිලි වන්නේ කුමක්ද? යන්න කරුණු 2කින් පැහැදිලි කරන්න . (ල. 4)

    (iii) මැතිවරණයකදී ඡන්ද අපේක්ෂකයෙකුට ජය හෝ පරාජය සඳහා මාධ්‍යයෙන් ලැබෙන සහයෝගයත්, විවේචනත් දැඩි ලෙස බලපායි. ඡන්ද අපේක්ෂකයෙකුට සාර්ථක මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීමට භාවිතයට ගත හැකි මූලධර්ම 3ක් විස්තර කරන්න. (ල. 6)

    (iv) 'මාධ්‍ය සංස්කෘතිය'' පිළිබඳ විවේචන පැවතුනත් සමාජය විසින්ම මාධ්‍ය සංස්කෘතිය ඉල්ලා සිටියි. එසේ ඉල්ලා සිටීමට හේතු 4ක් විස්තර කරන්න. (ල. 8)

04. (i) 1936 දී රැල්ෆ් ලින්ටන් විසින් සංස්කෘතිය පිළිබඳව දක්වූ නිර්වචනය ලියන්න. (ල. 2)

(ii) අන්තර් පුද්ගල සන්නිවේදනයේ සහ සමූහ සන්නිවේදනයේ කාර්යයන් 4 බැගින් දක්වන්න. (ල. 4)

(iii) අ). ලෝකය යහපත් තැනනක් බවට පත් කිරීමට ප්‍රධාන වශයෙන්ම සංවර්ධනය කළ යුත්තේ කුමන ධර්මතාද? (ල. 1)

ආ). එම ධර්මතා සඳහා මුල් වන්නේ කුමන සන්නිවේදන වර්ගයක්ද? (ල. 1)

ඇ). ඒ කසේද? විස්තර කරන්න. (ල. 4) (ල. 6)

(iv) සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘති වාර්තාවක් සම්පාදනයේදී වාර්තාවට ඇතුළත් වියයුතු කරුණු 4ක් දක්වා එම කරුණු විස්තර කරන්න. (ල. 8)

05. (i) ජනප්‍රිය සංස්කෘතියේ බලපෑමට ලක්වන තත්ත්වයන් නම් කරන්න. (ල. 2)

(ii) සාමූහික කටයුතුවලදී වගකීම පැහැර හැරිය හැකිය. වගවීම මඟහැරිය හැකිය. මෙය පැහැදිලි කරමින් වගකීම සහ වගවීම සමූහ සන්නිවේදන නිපුණතාවයක් වන්නේ කෙසේදැයි කරුණු 2ක් සහිතව විස්තර කරන්න. (ල. 4)

(iii) ශ්‍රී ලාංකිකයෝ වර්තමානයේ අන්තර්ජාතික සන්නිවේදන අන්තර්ඥානයක් භාවිතයට ගන්නා අතරම දේශීය සන්නිවේදන අන්තර්ඥානය අගේ කරනු දැකිය හැකිය. මෙය පැහැදිලි කර ස්වදේශී සන්නිවේදන අන්තර්ඥානයේ වැදගත්කම කරුණු 3ත් පැහැදිලි කරන්න. (ල. 6)

(iv) නව සන්නිවේදන තාක්ෂණික සොයා ගැනීම් නිසා ලේඛන රටා වෙනස්වී තිබෙන්නේ කෙසේදැයි කරුණු 4කින් විස්තර කරන්න. (ල. 8)

06. (i) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය ග්‍රාමීය පවුල්වල විභව ශක්තීන් හඳුනා ගැනීමටත්, ග්‍රාමීය ජනතාව ශක්තිමත් කිරීමටත් ගෙන ඇති ප්‍රධාන පියවර සටහන් කරන්න. (ල. 2)

(ii) ජීව භාෂාවක ලක්ෂණ 4ක් සඳහන් කර, දෙකක් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) සමාධි, ඡායාරූප ප්‍රදර්ශනක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සූදානම් කළාය. ඇය ඒ සම්බන්ධ පොත පත කියවමින්, එම ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයන්ගේ සහාය ද ලබා ගත්තාය. ගැළපෙන ඡායාරූප තෝරා ගත්තාය. ආරාධිතයන්ට ආරාධනා පත්‍ර ද යවා අවසානයේ ප්‍රදර්ශනය සාර්ථකව පැවැත්වූවාය.

මෙම ඡේදය ආශ්‍රයෙන් සමාධිගේ අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය ප්‍රගුණ කිරීමට භාවිතා කර ඇති නිපුණතා 5ක් දක්වන්න. (ල. 3)

එම නිපුණතාවන්ගෙන් දෙකක් සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ගය බැගින් දක්වන්න. (ල. 3) (ල. 6)

(iv) සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් දක්වන ආකාරයට ත්‍රිත්වාකාරවූ මානසික ව්‍යුහය තුළ මානසික ගැටුම් ඇතිවිය හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ල. 8)

07. (i) සන්නිවේදන බාධක නම් කර, එක් එක් බාධකයට උදාහරණය බැගින් දෙන්න. (ල. 2)

(ii) මාධ්‍ය සංස්කෘතියේ ව්‍යාප්තිය සම්ප්‍රදායික සමාජය වෙනස් කිරීමට දායක වෙයි. කරුණු දෙකකින් විමසන්න. (ල. 4)

(iii) ශ්‍රී ලංකාවේ සම්ප්‍රධායික ග්‍රාමීය ජන ජීවිතය තුළත් නාගරික සමාජය තුළත් සිදු කෙරෙන එකම සමාජ කාර්යයන් තුනකදී මහජන සම්බන්ධතාවය යොදා ගන්නා ආකාරවල වෙනස අවස්ථා තුන සඳහා වෙන වෙනම පැහැදිලි කරන්න. (ල. 6)

(iv) පාසල් බසයේ ගුවන් විදුලියෙන් ප්‍රචාරය වෙමින් තිබුණු ගුවන්විදුලි නාට්‍යයේ දෙබස් අසා සිටීමට බැරි තරම් බොළඳ, අශ්ලීල ව්‍යවහාරයන් විය.

වැඩිමහල් සිසු සිසුවියන් එකිනෙකාට ඉඟි කරමින් සිනාසෙනු දුටු ගුරුවරු ලැජ්ජාවෙන් බසයේ ජනෙල්වලින් පිටත බැලූහ.

ඉහත ඡේදය ආශ්‍රයෙන්, ජන මාධ්‍ය, සන්නිවේදන කාර්යයේදී මාධ්‍යයෙන් ඉටුවිය යුතු කවර කරුණුවලට හානි පමුණුවා තිබේදැයි කරුණු හතරකින් විස්තර කරන්න. (ල. 8)

## දෙවන වාර පරීක්ෂණය - 2018 - 13 ශ්‍රේණිය - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## I කොටස

### පිළිතුරු පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 01. - 3 | 11. - 4 | 21. - 5 | 31. - 1 | 41. - 4 |
| 02. - 3 | 12. - 3 | 22. - 2 | 32. - 2 | 42. - 2 |
| 03. - 4 | 13. - 3 | 23. - 4 | 33. - 4 | 43. - 1 |
| 04. - 1 | 14. - 4 | 24. - 1 | 34. - 2 | 44. - 4 |
| 05. - 4 | 15. - 3 | 25. - 2 | 35. - 4 | 45. - 2 |
| 06. - 4 | 16. - 2 | 26. - 4 | 36. - 1 | 46. - 2 |
| 07. - 3 | 17. - 3 | 27. - 4 | 37. - 3 | 47. - 1 |
| 08. - 1 | 18. - 2 | 28. - 3 | 38. - 3 | 48. - 2 |
| 09. - 5 | 19. - 2 | 29. - 2 | 39. - 2 | 49. - 1 |
| 10. - 5 | 20. - 4 | 30. - 5 | 40. - 5 | 50. - 4 |

## II කොටස පිළිතුරු

01. (i)
1. කපුටෙකු හැඬීම. 2.බල්ලන් උඩුබුරලීම
2. අහස ගෙරවීම 2. මුහුදේ රළ බිඳීම
3. මේස සීනුව 2. සයිරන් නලාව
4. ගුවන් විදුලිය 2. සංගීත භාණ්ඩ වාදනය (1/2 x 4 = ල. 2)

(ii) අන්ත්වර්තී පුද්ගල සන්නිවේදනය තමන් තුළම සිදුවේ. පංචේන්ද්‍රයන්ට ලැබෙන අරමුණු අනුව පළමුව හැඟීමක් ඇතිවී සිතිවිලි හටගැනීම චර්යාවෙන් ප්‍රකාශ කරනු ලබයි.

1. චිත්තවේග පාලනය මගින් ආවේගාත්මක චර්යා සහ පුද්ගලයා වැළකිය යුතු චර්යා පාලනය කිරීමට අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයට හැකිය.
2. කෙනෙකු යමක් ප්‍රකාශ කරන ආකාරය, ප්‍රකාශිත අන්තර්ගත ස්වභාවය, තීරණවලට එළඹෙන ආකාරය, ගැටළුවලට විසඳුම් ඉදිරිපත් කරන ආකාරය පාලනය කළ හැක්කේ අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ ගුණාත්මක භාවය මතය. (විස්තර කර තිබිය යුතුය) (2 x 2 = 4)

(iii)

| <u>ලැස්වෙල් මූලිකාංග</u> | <u>ෂැනොන් - වීවර් මූලිකාංග</u> |
|---|---|
| සන්නිවේදකයා | තොරතුරු මූලාශ්‍රය, පණිවිඩ, |
| පණිවිඩය | සම්ප්‍රේෂකය, සංඥාව |
| ග්‍රාහකයා | බාධක, ග්‍රාහකයා |
| බලපෑම | අග්‍රස්ථානය (ල. 2) |

| <u>ලැස්වෙල්</u> | <u>ෂැනොන් - වීවර්</u> |
|---|---|
| <u>සමානතා</u> | |
| 1. ඒක මාර්ගිකවේ. | ඒක මාර්ගි වේ. |
| 2. රේඛීය ආකෘතියකි. | රේඛීය ආකෘතියකි (ල. 2) |
| <u>අසමානතා</u> | |
| 1. බලපෑමෙන් කෙළවර වේ. | 1. අග්‍රස්ථානයට පැමිණෙයි. |
| 2. බාධක පිළිබඳ නොදක්වේ. | 2. බාධක පිළිබඳ දක්වෙයි. |
| 3. සන්නිවේදකයා සහ ග්‍රාහකයා ලෙස දක්වා තිබේ. | 3. ආකේතිකරණය, විකේතිකරණය පිළිබඳ දක්වයි. (ල. 2) |

(2+2+2=6)

(iv)
1. වාණිජමය හෝ වාණිජමය නොවන ඕනෑම සංවිධානයක පැවැත්මට එයට සම්බන්ධ මහජනයා අවශ්‍යවීම.
2. පාසලේ මහජන සම්බන්ධතාවේ අවශ්‍යතාව වාණිජ අවශ්‍යතාව ඉක්මවා යන්නක් වීම.
3. පාසල තුළ ඇති දක්ෂතාවයන් සහ විභවතාවයන් බාහිර පරිසරයට වටහාදීමට.
4. පාසල හා මහජනයා අතර ඇති සම්බන්ධය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වැඩි දියුණු කර ගැනීමට හැකිවේ.
5. පාසලේ කීර්තිය, ජනප්‍රියත්වය හා වලංගුතාවය වඩා ඉහළ තලයක පවත්වාගත හැකිවීම. විස්තර කර තිබිය යුතුයි. (ල. 8)

02. (i) අ). අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය
ආ) තොරතුරු දිගුකාලීන මතකයට ඇතුළත් කර ගැනීම (ල. 2)

(ii) එකඟ වේ. 1. නව මාධ්‍යයේ බලපෑම ජනමාධ්‍යයේ බලපෑම අභිබවා යන ආකාරය.
2. සමාජ ජාලාවල තොරතුරු ගලා යාමේ ප්‍රබල බව
3. නව මාධ්‍යයේ වගකීම භාර ගැනීමට කිසිවෙකු නැති ආකාරය සටහන් කර පැහැදිලි කර තිබිය යුතුය. ල. 4)

(iii) 1. ජනමාධ්‍ය විසින් පුද්ගලයන්ගේ ස්වාධීන දිවිපැවැත්මත් නිශ්චල ජීවිතයත් අත්පත් කරගෙන සිටී.
2. ස්වාධීනව තම දෛනික කටයුතු පිළිබඳව තීරණ නොගෙන ජනමාධ්‍ය මගින් ලබාදෙන තොරතුරු මත ගෘහ සංස්කෘතිය වෙනස් කර ගැනීම.
3. ආහාර ගැනීම, නිදා ගැනීම, පාඩම් කිරීම, විවේක ගැනීම, කථාබහ කිරීම යනාදී සියළු දෛනික කටයුතු ජනමාධ්‍ය වැඩ සටහන් වල පවතින ආකාරයෙන් සහ වෙලාවන් අනුව වෙනස් කර ගැනීම.
4. නිරායාසයෙන් ස්වාධීනව සමාජානුයෝජනය සිදුවූ පවුල තුළ පවුල ආශ්‍රිත කාරකයන්ගෙන් මිදී ජනමාධ්‍ය භූමිකාවන්ට අනුව සමාජානුයෝජන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම. මේ නිසා සැඳෑ කළ තිබූ ප්‍රිය සම්භාෂණ, සතුටු සාමීචිය, දරුවන්ගේ වෙනස්කම් හඳුනාගැනීම, මඟ පෙන්වීම සිදු නොවී ජන මාධ්‍යයට අනුව සිතන්නට, කතා කරන්නට, පරිභෝජනය කරන්නට, හැසිරෙන්නට ඉදිරි කටයුතු තෝරාගැනීමට පෙළඹී තිබේ. (නිවැරදි වෙනත් කරුණුවලටද ලකුණු දෙන්න) (ල. 6)

(iv) 1. ලුණු - ලුණු බද්ධ සමඟ බැඳී තිබේ.
2. චරකය - අතින් රෙදි විවීම, කදාර් රෙදි විවීම, ඉංග්‍රීසි අධිරජ්‍යයට එරෙහි අරගලයක් ඇතිකිරීම
3. රාජ-රාජ්‍ය -වීරත්වයෙන් යුතු සමාජයක්.
4. ස්වරාජ් - අහිංසා ව්‍යාපාරය පදනම් කරගෙන කෝපය, වෛරය, ප්‍රචණ්ඩත්වය යනාදියෙන් නිදහස්වීම. ප්‍රජාතන්ත්‍රවාදය - විස්තර කර තිබිය යුතුය. (ල. 8)

03. (i) 1. පුවත්පත් දැන්වීමක්.
2. ප්‍රසිද්ධ ස්ථානවල ඇලවීමට ඇගේ ඡායාරූපය සහිත කුඩා A4 ප්‍රමාණයේ දැන්වීම්.
3. ඇගේ පෞද්ගලික හඳුනාගැනීමේ තොරතුරු (වන නම, වයස, හමේ පැහැය යනාදිය දක්වෙන) ඡායාරූපයක් සහිත අත් පත්‍රිකාවක් බෙදා හැරීම.
4. නිවැසියෙකුගේ මුහුණු පොතේ ගිණුමේ, ඇය සමඟ ඇති ඥාතිත්වය දක්වෙන එකට ගත් ඡායාරූපයක් සහිතව, හිතවත් අයට පණිවිඩ යැවීම.
5. දුරකථනයෙන් විවිධ ආයතන ස්ථාන සහ පුද්ගලයන් දැණුවත් කිරීම. (ල. 2)

(ii) 1. මිනිසා සාමූහිකව ජීවත්වීමේ නැඹුරුවක් දක්වන සත්ත්වයෙකු වීම. ළමා කාලයේ ස්වාධීනව ජීවත්විය නොහැකි වීම. ඉපදීමේ සිට දිගු කාලයක් යැපෙන්නෙකු වීම.
2. ආරක්ෂාව ජීවිතය පුරාම අවශ්‍ය වීම. එම නිසා සාමූහිකව ජීවත්වීමේ නැඹුරුව.
3. මිනිසා ඉහළ බුද්ධිමය විභවතා සහිත සත්ත්වයෙක් වීම. ඒකරාශීව බුද්ධි වර්ධනය සිදුවීම. තම පැවැත්ම වෙනුවෙන් ඒකරාශීවී ජීවත්වීම. (ල.4)

(iii) 1. මාධ්‍ය සාකච්ඡාව සඳහා තම අරමුණු ගොඩ නැංවීම.
2. මාධ්‍ය සාකච්ඡාවේදී ඉදිරිපත් කරනු ලබන අදහස් නිසි ලෙස ගොනුකර ගැනීම.
3. මුද්‍රිත ශ්‍රව්‍ය දෘශ්‍ය ලෙස අවශ්‍ය ආකාරයට තොරතුරු ප්‍රති නිර්මාණය කිරීම.
4. මාධ්‍ය සාකච්ඡාවට සහභාගිවීමට තෝරාගත් මධ්‍ය වෙත වේලාවට සූදානම්ව පැමිණෙන බවට සහතික කර ප්‍රතිචාර ලබා දීම. (විස්තර කරන්න, නිවැරදි වෙනත් කරුණු වලටද ලකුණු දෙන්න)
(ල. 6)

(iv) මාධ්‍ය සංස්කෘතිය විවේචනයට ලක්වීමට හේතුව ඉදිරිපත් කරන්න.
1. නවීකරණය වීමට සමාජය තුළ පෙළඹවීමක් තිබීම.
2. මාධ්‍ය තුළින් සමාජයට වඩාත් පොදු වූ තොරතුරු හුවමාරුවීම.
3. මාධ්‍ය තුළින් සමාජයට වඩාත් පොදු වූ තොරතුරු හුවමාරුවීම.
4. මාධ්‍ය සංස්කෘතියේ ආකර්ෂණීය භාවයට සමාජය ඇලුම්කිරීම.
5. නව සමාජ අවශ්‍යතා මාධ්‍ය සංස්කෘතියෙන් නිර්මාණය කිරීම හා සමාජ අවශ්‍යතා ඉටුකරගැනීමට මාධ්‍ය සංස්කෘතිය දායකවීම. (විස්තර කරන්න) (ල. 8)

04. (i) සංස්කෘතිය යනු ''සාමාජිකයන්ගෙන් ජීවන ක්‍රමයට, එනම් ඔවුන් විසින් ඉගෙන එක් රැස් කොට ගන්නාවූත් බෙදා හදාගෙන පරම්පරාවෙන් පරාවට ගෙන යනු ලැබූ අදහස් උදහස් හා පුරුදු වලටය(ල. 2)

(ii) සන්නිවේදන වර්ග කෙටියෙන් හඳුන්වන්න.

<u>අන්තර් පුද්ගල සන්නිවේදන කර්යය :</u>

1. අන්ර් පුද්ගල සබඳතා ගොඩ නැගීම. 2. අධ්‍යාපනය ලැබීම / ලබාදීම
3. තොරතුරු අත්දැකීම් හුවමාරු කරගැනීම. 4. පෙළඹවීම සහ මෙහෙයවීම. 5. විනෝදාස්වාදය

<u>සමූහ සන්නිවේදන කාර්ය</u>

1. සමාජ ඒකාබද්ධතාවය ඇතිකිරීම. 2. තොරතුරු අත්දැකීම් හුවමාරුව
3. අධ්‍යාපනය 4. සමාජානුයෝජනය
5. සංස්කෘතිය පවරා ගැනීම. 6. විනෝදාස්වාදය (ල. 4)

(iii) අ. මානව සාමය සහ මානව ධර්මතා සංවර්ධනය මගින් (ල. 1)

ආ. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය (ල. 1)

ඇ. මානව සාමය සහ මානව ධර්මතා සංවර්ධනය පුද්ගල මානසික සාමය පුද්ගල ධර්මතා සංවර්ධනය මගින් ඇතිවේ. තම තමන්ගේ අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය යහපත්ව, සාමකාමීව පවත්වාගත හැක්කේ නම් සමාජය වඩාත් යහපත් තැනක් බවට පත්කර ගත හැකිය. විස්තර කරන්න. (ල. 4)

(ල. 6)

(iv) 1. නියාමනය කළ ආකාරය. 2. අයවැය පාලනය හා සම්පත් උපයෝජනය

3. අනුග්‍රාහකත්වය හා විශේෂඥ උපදේශන

4. මුහුණපෑමට සිදුවූ ගැටලු අතපසුවීම් හා වැරදීම් විස්තර කරන්න. වෙනත් කරුණු වලටද ලකුණු දෙන්න.

(2 x 4 = 8)

05. (i) පුද්ගල චර්යාවන්, ආර්ථික පැවතුම්, ජනතාවගේ අපේක්ෂාවන්, ව්‍යාපාරික සහ මාධ්‍ය ආයතනවල ආදායම සහ පැවැත්ම, ජනතාවගේ පරිභෝජන රටා, සමාජ තත්ත්වයන්, මානව චර්යාවන් සහ චින්තනය, හර පද්ධති, සංවේදීතාව, බුද්ධි මට්ටම. (ල. 2)

(ii) 1. සමූහ සන්නිවේදන කාර්යයේදී කණ්ඩායමේ අරමුණු ඉටුකර ගැනීමට සාමූහිකව වැඩකළ යුතුය. වැඩ එක් එක් අය අත බෙදී යාමේදී එය ඉටුකිරීමේ වගකීම කණ්ඩායමේ සාමාජිකයන්ට පැවරෙයි.

වගවීම කිසිවෙකු විසින් නොපවරයි. මඟහැරෙන, තමන්ට නොපැවරෙන වැඩ පිළිබඳව බැඳීමක් ඇතිකරගෙන නිම කිරීම වගකීමයි. වගකීම පැහැර හැරීමෙන් සමූහයා අතර බැඳීම කඩ වී සාමූහික ක්‍රියාවලිය බිඳ වැටෙයි.

2. සමූහය ගොඩ නැඟීම, පැවැත්ම සහ සංවර්ධනය සිදුවන්නේ වගකීම් සහ වගවීම තුළින්ය.

3. වගකීම පැහැර හැරීම නිසා සාමූහික ක්‍රියාවලිය නිසි ලෙස ඉටු නොවීම පිළිබඳව අන්‍යයන්ට ප්‍රශ්න කිරීමේ අයිතියක් ගොඩ නංවයි. මේ ආකාරයට සාමූහික වැඩ වගකීම සහ වගවීම සමූහ සන්නිවේදන නිපුණතාවයකි. (විස්තර කරන්න) (ල. 4)

(iii) වර්තමාන දියුණු සමාජයට ශ්‍රී ලාංකිකයෝ විවිධ රටවල අන්තර් ඥානයන්ගේ ඵල (නිෂ්පාදනයන්) සහ සන්නිවේදන තාක්ෂණයේ නිමවුම් අද භාවිතයට ගනී.

ස්වදේශීය අන්තර්ඥානයේ වැදගත්කම

1. ස්වදේශීක විවිධ සංස්කෘතීන්ගේ ලක්ෂණ විද්‍යාමානවීම.
2. ස්වදේශීක චින්තනය ස්වදේශීය සන්නිවේදන අන්තර්ඥානය මත ගොඩ නැංවී තිබීම.
3. සිරිත්, විරිත්, සිතුම් පැතුම් සමාජය සංකල්ප කලාව යනාදියෙන් සන්නිවේදන අන්තර්ඥානය නිරූපණය කරමින් ස්වදේශීක ජනතාවගේ සන්නිවේදන අන්තර්ඥානය මත ස්වදේශික ජනතාවගේ පැවැත්ම රඳා පැවතීම. පැහැදිලි කරන්න. (ල. 6)

(iv) 1. අතින්, යතුරුලියනයෙන් ලිවීම වෙනුවට පරිගණකයෙන් ජංගම දුරකථනයේ සහ වෙනත් තාක්ෂණික මාධ්‍ය උපකරණ භාවිතයෙන් ලිවීම සිදුකිරීම.

2. ලිඛිත භාෂාව භාවිතයේදී අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ සහිත ගුණාත්මක භාෂාව යොදා ගැනීම මාධ්‍යයෙන් මාධ්‍යයට (පුවත්පත, ගුවන් විදුලිය, රූපවාහිනි, ග්‍රන්ථ යනාදී ලෙස වෙනස් වීම).

3. නව මාධ්‍ය මත භාවිත කරන බොහෝ ලේඛන රටාවන් කෙටි, සරල සංස්කරණයෙන් තොර ලේඛන රටා වීම.

4. නූතන කථන ව්‍යවහාරයන් ජනමාධ්‍ය තුළත්, නව මාධ්‍ය තුළත් බහුලව භාවිතා වීම.

5. මිශ්‍ර භාෂාවන්, කෙටි සංඥා, විවිධ ආකෘති භාවිතා කිරීම.

6. අසම්මත භාෂා ව්‍යවහාරයන් හාස්‍ය ජනක යෙදුම්, කෙටි යෙදුම්, කාටූන් ස්වරූපයන් විවිධ නිර්මාණාත්මක ක්‍රමවේද තුළ සංඛ්‍යාත්මකව දැක්වීම යනාදිය විස්තර කර තිබිය යුතුය. (ල. 8)

06. (i) කුඩා කණ්ඩායම් නිර්මාණය කර, සමෘද්ධි සමිති ගොඩ නැඟීම, ඒ මගින් ග්‍රාමීය පවුල්වල විභව ශක්තීන් හඳුනාගෙන විවිධ ක්‍රමෝපායන් මගින් ග්‍රාමීය ජනතාව ශක්තිමත් කිරීම. (ල. 2)

(ii) 1 සන්නිවේදනය සඳහා යොදා ගනිමින් පවතින භාෂාවක් වීම.
2. නිරන්තරයෙන් භාවිතාවීම නිසා එය පෝෂණය වීම.
3. වඩාත් සංවේදී ලෙස සහ නිර්මාණශීලී ලෙස අදහස් ප්‍රකාශ කළ හැකි වීම.
4. නවීණ තාක්ෂණය සහ නවීණ සොයා ගැනීම්. විවිධ ක්‍රියාකාරකම් දේශීය සමාජය වෙත ජාත්‍යන්තර භාෂාවන්ගෙන් ගලා ඒමේදී ඒ සඳහා නව වචන, වගන්ති නිර්මාණය කර ගැනීමට භාෂාවේ ශබ්ද කෝෂය වර්ධනය කළ හැකිවීම. (දෙකක් පැහැදිලි කිරීමට ලකුණු 2) (ල. 4)

(iii) 1. තොරතුරු රැස්කිරීම - පොතපත කියවීම. අදාළ තොරතුරු සටහන් ලබාගැනීම.
2. ප්‍රදර්ශනයට අදාළ තොරතුරු පමණක් තෝරාගැනීම - ඡායාරූප අතරින් ගැළපෙන තොරතුරු පමණක් තෝරා ගැනීම.
3. තාර්කිකව තීරණ ගනිමින් ප්‍රදර්ශනයේ ස්වභාවය නිගමනය කර ගැනීම - ආරාධිතයින්ට ආරාධනා පත්‍ර යැවීම, ස්වභාවය සැලසුම් කරගැනීම.
4. අවශ්‍යතාවයට ගැළපෙන ලෙස ඡායාරූප ප්‍රදර්ශනය සකස් කර ගැනීම.
5. ප්‍රදර්ශනය පැවැත්වීම. (ල. 6)

(iv) ත්‍රිත්වාකාරවූ මානසික ව්‍යුහය වන්නේ,
1. සුපහන් සිත 2. පහන් සිත 3. යටි සිතයි.
ගැටුම් ඇතිවන්නේ මනසේ ත්‍රිත්වාකාර ව්‍යුහය ක්‍රියාත්මක වන ආකාරය එකිනෙකට පරස්පර අදහස් පවත්වන නිසාය. දෛනිකව ක්‍රියාකිරීමේදී මෙම ත්‍රිත්වාකාර ව්‍යුහය තුන් ආකාරයකට තීරණ ඉදිරිපත් කිරීමෙන් මනස තුළ ගැටුම් උපදී. (ල. 2)
1. සුපහන් සිත - උත්තරීතර පරමාදර්ශ වෙනුවෙන් පෙනී සිටියි.
2. පහන් සිත - පුද්ගලයාගේ එදිනෙදා කටයුතු හසුරුවයි.
3. යටි සිත - පුද්ගලයාට ආවේනික ස්වභාවික සහජාශයන් වෙනුවෙන් පෙනී සිටියි.
පැහැදිලි කරන්න. (ල. 6) (ල. 8)

07. (i) 1. අර්ථ බාධක. 2. මාධ්‍ය බාධක
අර්ථ බාධක - උදා : භාෂාව ආශ්‍රිත බාධක මාධ්‍ය බාධක - උදා: තාක්ෂණික බාධක(ල. 2)

(ii) මධ්‍ය සංස්කෘතිය හඳුන්වන්න.
1. මාධ්‍ය සංස්කෘතිය තරුණ, ළමා, කාන්තා පිරිස්වල චර්යාවන්හි බරපතල වෙනස්වීම් ඇතිකිරීම.
2. අනවශ්‍ය පරිභෝජන අවශ්‍යතා සහ පරිභෝජන රටා බිහි කිරීම.
3. සමාජය මාධ්‍ය සංස්කෘතියේ උපක්‍රමශීලී ප්‍රවේශයන්ට හසුකර ගැනීම.
4. තුන්වන ලෝකයේ සමාජීය මතවාදය වෙනස් කිරීමේ යටි අරමුණු ඉටුවීම. (ල. 4)

(iii) මළගෙවල්, දානමය කටයුතු, මංගල කටයුතු යනාදියේදී නාගරික සමාජයේත් ග්‍රාමීය සම්ප්‍රදායික ජන ජීවිතයේදීත් මහජන සම්බන්ධතාවය සිදුවන ආකාරය වෙන වෙනම දක්වා තිබිය යුතුය. (ල. 6)

(iv) 1. සදාචාරය ගොඩනැංවීම.
2. සමාජය හික්මවීම
3. සංස්කෘතික සම්ප්‍රේෂණය
4. ජාතික අනන්‍යතාව (ල. 4) විස්තර කිරීමට (ල. 4) (ල. 8)